පුවත් වාර්තාවන්ට සිරස්තල යෙදීමේදී සහ පුවත් වාර්තාවන් රචනයේදී නිර්මාණශීලී වීමට ඇති හැකියාව කිසිසේත්ම අත්හැර දැමිය හැකි නොවේ. කෙසේ නමුත් එසේ නිර්මාණශීලීව සිරස්තල යෙදීමේදී හා පුවතක් ඉදිරිපත් කිරීමේදී, පුවත සැහැල්ලු කොට දැක්වීමකින් තොරව ඉදිරිපත් කළ යුතු නොවේදැයි පාඨක අප ඇසිය යුතුයි.

ඊට උදාහරණයක් ලෙසින්, අරුණ පුවත්පතේ (10/18) පළවූ "කොන්දට තෙගාගන්න ආ කතට වෙද මහතා අමුතු තෙලක් ගාලා" යන සිරස්තලයෙන් යුතු පුවත දැක්විය හැක. එම පුවත කියවන විට අපට පැහැදිලි වන්නේ එය ලිංගික අතවරයකට තැත් කිරීමක් බවයි. ලිංගික අතවරයකට තැත් දැරීමක් වුවද නීතිය ඉදිරියේ වරදක්ම වෙයි.

ඒ අනුව,

1) "අමුතු තෙලක් ගාලා" යන ව්‍යංගාර්ථයෙන්, ලිංගික අතවරයකට තැත් දැරීමක් එහි නිසි බරපතල භාවය සමගින් නිරූපණය වේ යැයි ඔබ සිතන්නේද?

2) ඔබ සිතන ලෙසට, "කොන්දට තෙල් ගාගන්න ආ කතට වෙද මහතා අතවර කරන්න තැත් කරලා" වැනි විකල්ප සිරස්තලයක් මෙම පුවත් වාර්තාවට සුදුසු නොවේද?

**#MediaEthicsSL #lka #sinhalanews #Aruna**